**ජාතික ළමා සංවර්ධන අරමුදල - 2014**
-------------------------------------------

ජාතික ළමා සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ළමා සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පත් සඳහා වර්ෂයට අදාළ පොලී ආදායම රු.427,500 ක් වුවත් එය රු.378,750ක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර බැංකු ප්‍රකාශය අනුව 2014 දෙසැම්බර් 19 වන දින ලැබී තිබූ රු.48,750 ක පොලී ආදායම, ආදායම් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් ලැබීම් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් ලැබීම් ලෙස දක්වා තිබූ රු.508,610 ක් තුළ රු. 106,682 ක් 2013 දෙසැම්බර් මාසය තුළ ලැබී තිබුණු අතර රු. 401,928 ක් 2014 වර්ෂය තුළදී ලැබී තිබුණි. මෙම මුදල් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම නිසා 2013 හා 2014 වර්ෂවල කොඩි අලෙවි ආදායම පිළිවෙළින් රු.106,682 කින්ද රු.353,178 කින් ද අඩුවෙන් පෙන්වා තිබුණි.

### 2.3 නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහය. | අරමුදල පාලනය අන්තර් අමාත්‍යාංශ අධීක්ෂණ කමිටුව මගින් සිදුකළ යුතු අතර අවම වශයෙන් මාසයකට වතාවක් එම කමිටුව රැස්වී ඉල්ලුම් පත්‍ර සලකා බැලිය යුතු වුවද ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද එක් වරක්වත් කමිටුව රැස්වී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ අළුතින් ආධාර දීමට ළමුන් තෝරාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,077,828 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු. 689,129 ක අතිරික්තයක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,766,957 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ළමා දින කොඩි අලෙවිය වූ අතර සමාලෝචිත වර්ෂයේ ලෝක ළමා දින කොඩි අලෙවි කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 335 කට කොඩි 380,000 ක් රු. 29,080 ක තැපැල් ගාස්තුවක් වැයකර යවා තිබුණි. මෙම කොඩි අලෙවියෙන් ලැබෙන මුදලින් සියයට 50 ක් නොවැම්බර් 30 දිනට පෙර ළමා සංවර්ධන අරමුදලට බැර කරන ලෙස දන්වා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් බැර කර තිබුණේ කාර්යාල 75 කින් පමණි. 2015 ජූලි 30 දිනට තවත් කාර්යාල 211 කින් මුදල් එවා තිබූ නමුත් කොඩි 50,000 ක් යැවූ කාර්යාල 49 කින් මුදල් එවා නොතිබුණි. ඒ අනුව කොඩි අලෙවි ආදායම් රැස්කර ගැනීම සම්බන්ධයෙන් අරමුදල විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2015 ජූලි 03 දිනදීය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂයට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අරමුණු ළඟාකර ගැනීම පිළිබඳව නිසි ඇගැයීමක් කළ නොහැකි විය.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.4 (අ) ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තාව, විගණකාධිපතිගේ වාර්තාව සමඟ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී මාස 05 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2007 වර්ෂයේ සිට එසේ කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වරින්වර දැනුම් දෙන ලදී. ආදායම් එකතු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.